## වැස්ස වහිනවා

බිංදු බිංදු බිංදු වැටී
වැස්ස වහිනවා
ගහ කොළ මල් තෙමී තෙමී
බිමට නැමෙනවා
චූටි චූටි චූටි කුරුල්ලෝ
ඉගිලෙනවා
උන් හැමදෙන ඉගිල්ලිලා
පියඹා යනවා

හිරු කුමරා වළාකුලින්
සැඟවී යනවා
සැම තැනම අඳුරුවෙලා
නොපෙනී යනවා
හෝ හෝ හෝ හෝගාමින්
වැස්ස වහිනවා
වතුර පිරී දිය ඇලි සේ
ගලා බහිනවා

♦ **කවුන්දිකා ජයවර්ධන**
මාරපොල මහා විද්‍යාලය,
මාරපොල Sri Lanka

## පාසැලේ වේවැල

චට චට චට පට
පුංචි ළමුන් හට
වරදක් කළ විට
දඬුවම් එක විට

අප විදුහල් පතිගෙ අතේ
හැමදා නිරතුරුව ඇතේ
දරුවන්ගේ පුංචි වතේ
කඳුළු බිංදු නිතර ඇතේ

ගුරුවරුන්ගෙ මේසය මත
උඩඟුකමින් පුරවා සිත
හිරිවැටෙමින් ළමුන්ගෙ ගත
මේසය මත වේවැල ඇත

♦ **රෝස් දිලූපා මධුෂානි**
8 වසර සී
හරිස්චන්ද්‍ර මහා විද්‍යාලය
මීගමුව Sri Lanka




**Children's Corner**

## Postman Cats ලියුම් බෙදු බළල්ලු

Cats were used as a novel way to deliver the post in 19th century Belgium. They trained 37 animals to take mail to villages within 20 miles of Liege city centre in 1879. However, the experiment was soon abandoned because letters rarely made it to the right house - the cats were too undisciplined.



19 වන සිය වසේ දී බෙල්ජියමේ ලියුම් බෙදීම සඳහා අළුත් ක්‍රමයක් සොයා ගැනිණ. එනම් ඒ සඳහා පුහුණු කළ බළලුන් යොදා ගැනීමයි. 1879 දී එසේ පුහුණු කරන ලද බළලුන් 37 දෙනෙකු ලීජ් නගරයේ සැතපුම් 20 ක් පමණ ප්‍රදේශයක් වටවන සේ ලියුම් බෙදීමට යවන ලදී. මුල් දින කීපයේදී වැඩේ සාර්ථක බව පෙනී ගියත් පසුව දැනගත්තේ එම ලියුම් නියම අයිතිකරුවනටනොලැබුණු බවයි. ඒ බළල් පියුන් වැඩේ අත්හැර දමන්නට සිදු විය. බළලුන් විනය ගරුක නොවන සතුන් කොටසක් බව තැපැල් දෙපාර්තමේන්තුවට පසුව තේරුම් ගියේය.

♦ *Auntie Ramani* (*රමණී නැන්දා*)

## මගේ සීයා

පුළුන් වගේ දිග රැවුලයි
පිටිපස්සේ කොණ්ඩයයි
පුංචි රස කතා කියයි
සීයා අපට හරි ආදරෙයි

නිතර නිතර බුලත් හපයි
සවසට ඇවිදින්නට යයි
දුවේ කියා අප අමතයි
සීයා අපට හරි ආදරෙයි

♦ **නදිශානි රත්නසිරි**
ජනාධිපති විදුහල
හෝමාගම Sri Lanka

## වතුසුදු ගස

හිරු කුමරා එබී බලන වා
සමනලයෙක් පියඹා යන වා
වතුසුදු මල් කැකුළු පිපෙන වා
සැමදෙනා එදෙස බලන වා

වතුසුදු ගස දෙපස වැනෙන වා
වත්ත පුරා සුවඳ හමන වා
බඹරුන් විත් රොන් ගෙනයනවා
පුංචි අපිත් එවිට නටන වා

♦ **බුද්ධිකා සේනානායක**
උසස් බාලිකා විදුහල
මහනුවර Sri Lanka


**BOC**

ඔබට විශ්වාස තැබිය හැකි බැංකුවයි

**ලංකා බැංකුව**
**BANK OF CEYLON**

**ලන්ඩන් ශාඛාව**

**වසර 57 කටත් වඩා කාලයක් පුරා ලන්ඩන් නගරයේ ඔබේ මුදල් අවශ්‍යතා සපුරාලමින් සේවය කරයි.**

හෙට දවසේ සිහින සැබෑකරන
**NRFC ගිණුමක් අරඹන්න !**
*උපයාගත් විදේශ මුදලට වැඩි වටිනාකමක් !*

***ලංකා බැංකුව අනේවාසික ගිණුම් හිමියන් සඳහා නොමිළයේ ජීවිත රක්ෂණ ව්‍යාපෘතියක් යළි හඳුන්වා දෙයි.***

පවුම්, ඩොලර්, යූරෝ හෝ රුපියල් වලින් ඔබ ශ්‍රීලංකාවට මුදල් යවන විට අපේ සේවා භාවිතා කරන්න. එය ඉතා සුරක්ෂිතය, ලාභදායකය, කාර්යක්ෂමය.

ශ්‍රීලංකාව පුරා ලංකා බැංකු ශාඛා 301 කි. ඉන් 256 කම කටයුතු පරිගණක ජාලගතකර ඇත. ඕනෑම ශාඛාවකින් පවුලේ අයට හෝ නෑදෑ හිතවතුන්ට මුදල් යැවීමේ දී එය ගිණුම් වලට බැරකිරීමට හෝ ශාඛාවේදී මුදල් අතටම ලබාදීමට හෝ හැකි ය.

★ ***ආකර්ෂණිය විනිමය අනුපාතිකය.***
★ ***ඕනෑම වානිජ හෝ ඉතිරිකිරීමේ බැංකුවකට යැවිය හැක.***

ඔබගේම චෙක්පත් **කළමනාකරු, ලංකා බැංකුව, ලන්ඩන්** යනුවෙන් ලියා, ගිණුම් හිමියාගේ නම, ගිණුම් අංකය, බැංකුවේ නම හා ශාඛාව දක්වා තැපැල් මගින් අපට යොමුකරන්න. (බ්‍රිතාන්‍ය මූල්‍ය රෙගුලාසිවලට යටත්ව)
***වැඩි විස්තර සඳහා :***

**No 1, Devonshire Square, London EC2 M4WD**
**Phone : 020 7377 1888 Fax: 020 7377 5430**
**e-mail : bankofceylon.uk@btclick.com**
**Our Web - www.boc.lk**
**Nearest Railway Station - Liverpool Street ( tube & Rail ) Bishop Gate Exit**


## Furore grows over Rushdie's Knighthood
## රෂ්ඩි ලැබූ නයිට් නාමයට මුස්ලිම් විරෝධය



Outrage over **Salman Rushdie's** knighthood threatened to ignite across the Muslim world yesterday. Security around the writer was reviewed by Scotland Yard as an Iranian group placed an £80,000 bounty on his head.


The same group accused the Queen of mocking Muslims with the honour.

In London, Lord Ahmed, Britain's first Muslim peer, said he had been appalled by the award to a man he accused of having 'blood on his hands'.

In Pakistan, where effigies of the Queen and 59-year-old Rushdie were burned, a minister appeared to justify suicide bombings as a response to the knighthood.

විවාදයට තුඩුදුන් සාතන්ගේ කවි **Satanic Verses** නම් පොත ලියා මුළු ලෝකයේම මුස්ලිම්වරුන්ගේ වෛරයට සහ හෙලාදැකීමට පාත්‍රවූ දැන් එංගලන්තයේ වසන ලේඛක සල්මන් රෂිඩිට පසුගිය සතියේ මහරැජිණ විසින් පිරිනමන ලද නයිට් නාමයට දැඩි විරුද්ධත්වය පාමින් එංගලන්තයේ ද බොහෝ රටවල ද මුස්ලිම්වරු උද්ඝෝෂණ පැවැත්වූහ. පකිස්ථානයේ මුස්ලිම්වරු රෂිඩිගේ සහ බ්‍රිතාන්‍ය මහරැජිණගේ පඹයන් සාදා ඒවා පුළුස්සමින් කෑ මොරගැසූහ. ඉරානයේ මුස්ලිම් කණ්ඩායමක් විසින් රෂිඩිගේ හිසට පවුම් 80,000 ක ත්‍යාගයක් දෙන බව කියා ඇති නිසා දැන් යළිත් එංගලන්තයේ රෂිඩිට ඇති ආරක්ෂාව තවත් තරකර ඇත.

## රෝෂනයිට්ස් නිහාල්ගෙන් අළුත් ගී එකතුවක්



**70** දශකයේ ශ්‍රී ලංකාවේ ප්‍රසංග වේදිකාව තුළින් අතිශයින් ජනප්‍රියට පත් සංගීත කණ්ඩායමක් වන රෝෂනයිට් වාද්‍ය වෘන්දයේ රිදම් ගිටාර් වාදක සහ ගායන ශිල්පි නිහාල් චන්ද්‍රසේකර දිගු විරාමයකින් පසු යළිත් ශ්‍රීලංකා සංගීත ක්ෂේත්‍රයට අවතීර්ණව සිටී.

කලක් සවුදි අරාබියාවේ රැකියාවේ නියුක්තව සිටි නිහාල් විසින් නිර්මාණය කරනලද ගීත අතුරින් ගීත තුනක් දිවයිනට පැමිණි පසු ඔහු පටිගත කළේය. ඒ ඔහු විසින්ම ගී පද රචනා කොට, තනු නිර්මාණය කොට ගායනා කරන ලද ***දෑසින් ඔබේ , රෑ සඳ පානේ , ඔබෙ සෙනෙහස*** යන ගී හතරයි. මෙකී ගීත කිහිපය මේ දිනවල ශ්‍රීලංකාවේ **FM** ගුවන්විදුලි නාලිකා රැසකම විකාශනය වන අතර ඔහුගේ ***රෑ සඳපානේ*** ගීතය ජාතික රූපවාහිනියේ නිම්තෙර වැඩසටහනින් ප්‍රචාරය විය.

මේ ගී සියල්ලටම සංගීතය සපයන ලද්දේ රෝෂනයිට් සංගීත කණ්ඩායම විසින් වන අතර, මෙහි සංගීතය අධ්‍යක්ෂණය කළේ රෝෂනයිට් සංගීත කණ්ඩායමේ සැක්සපෝන් වාදක සංගීතඥ ආනන්ද පෙරේරා ය. ඉදිරියේදී මෙම ගීත රූප ගතකිරීමට නිහාල් අපේක්ෂාවෙන් සිටී.

ඔහුගේ සංගීත දිවිය සර්වප්‍රකාරයෙන්ම සාර්ථකවේවායි අපේ සුපැතුම් පිරිනමන අතර, නිහාල් චන්ද්‍රසේකරගේ ඉදිරි ගී සඳහා පද රචනා යොමුකරන්නට කැමති ගීපද රචනාවේ දක්ෂ රසික රසිකාවියන්ට ඒ සඳහා අවස්ථාව ඇත. ඔබේ පද නිර්මාණ මෙසේ යවන්න.

**නිහාල් චන්ද්‍රසේකර**
**නො: 85 A මුත්තෙට්ටුව පාර**
**මිරිහාන, නුගේගොඩ**

♦ ***වික්‍රම්***